**සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - 2015**

**------------------------------------------------------**

**සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනතේ 21 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

---

රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීම සම්බන්ධව භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

**2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03**

---

අස්තිත්වයක් විසින් පූර්ව කාලපරිච්ඡේදවලදී සිදු වී ඇති වැරදි සොයාගැනීමෙන් පසුව නිකුත් කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහිම අතීතානුයෝගීව නිවැරදි කිරීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයන්ට අදාළව කරන ලද ගැලපීම් රු.963,614 ක් අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07**

---

එක් එක් දේපල, පිරියත හා උපකරණ පන්තියේ ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ භාවිතා කළ ක්ෂය අනුපාතිකය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් පිරිවැය රු.1,632,347 ක් වූ මෙවලම් හා උපකරණ සම්බන්ධයෙන් භාවිතා කළ ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කාර්යාල ලීබඩු, උපකරණ හා යන්ත්‍ර ක්ෂයවීම් රු. 187,998 ක් වැඩියෙන්ද මෙවලම් සහ උපකරණ ක්ෂය රු. 91,938 ක් අඩුවෙන්ද ගිණුම් ගතකර තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂිත වියදම හා වෙන්කිරීම් රු.650,410 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු ආදායම් බදු මුදල ගණනය කිරීමේදී ඒ වෙනුවෙන් රඳවාගත් රු.639,910 ක මුදලක් ගැලපීම් කර තිබුණද තවදුරටත් එය ලැබිය යුතු බද්දක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සුනාමි නිවාසවල අයිතිය පැවරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබූ රු.1,866,395 ක අත්තිකාරම් නිරවුල් කර නොතිබියදී වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින රජයේ මහල් නිවාස අළුත්වැඩියා කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ රු.30,000,000 ක රජයේ ප්‍රදාන, වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**2.2.4** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද ණයගැතියන් 08 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.5,111,256 ක් වූ ණය ශේෂ, 2006 වර්ෂයේ සිට අයවියයුතු රු.577,464 ක සමතකරන ගාස්තු හා 2009 වර්ෂයේ සිට පොම්පාගාර නඩත්තු කටයුතු වෙනුවෙන් ගම්පහ රෝහලෙන් අයවිය යුතු රු.577,936 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ද අයකරගෙන නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබාදී තිබුණු රු.350,568 ක අත්තිකාරම් මුදල විගණන දිනය දක්වාම නිරවුල් කර නොතිබුණි.

**2.3** නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල(සංශෝධන) පනතේ පස්වන ඡේදයේ (ඌ) වගන්තිය | සහාධිපත්‍ය දේපලවලට අයත් පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීමට කටයුතු කළ යුතු වුවද මාළිගාවත්ත සහ ජල්තර නිවාස යෝජනා ක්‍රමවල පොදු පහසුකම් පළාත් පාලන ආයතන වෙත පැවරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය VIII වන පරිච්ඡේදයේ 9.2 වගන්තිය | එකම රාජකාරි කාලය සඳහා නිවාඩු දින දීමනා (1/30) සහ අතිකාල දීමනා යන දීමනා දෙකම ගෙවිය නොහැකි වුවත් එයට පටහැනිව අධිකාරිය විසින් එකම සේවා කාලය සඳහා සේවකයින් 42 දෙනෙකුට දීමනා දෙකම එකවර ගෙවීම නිසා අතිකාල දීමනාවට අමතරව නිවාඩු දින දීමනා ලෙස එකතුව රු.781,564 ක් ගෙවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371 (2) | අත්තිකාරම්, මාණ්ඩලික නිළධාරීන්ට පමණක් ලබාදිය යුතු වුවද ඊට අනුකූල නොවන පරිදි 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අධිකාරියේ රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයින් වෙත එකතුව රු.469,727 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 757(2) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අයිතම 265 ක ඌනතාවයක් හා අයිතම් 466 ක අතිරික්තයක් පැවතුණ ද ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ<br>-------------------------- | |
| (I) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන චක්‍රලේඛයේ 3.2.1 හා *3.2.2* වගන්ති | රාජකාරි කටයුතු ඉටුකිරීමේදී මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හිදී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතු වුවත් ඊට පටහැනිව අධිකාරියේ සභාපති සහ සාමාන්‍යාධිකාරි වෙත එකතුව රු.120,764 ක ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (II) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන චක්‍රලේඛයේ 8.3.8 වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සෙවන අරමුදලට රු.3,000,000 ක් පරිත්‍යාග කර තිබුණි. |
| (III) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/ 2/2015 දරන චක්‍රලේඛයේ 04 වගන්තිය | මෙම චක්‍රලේඛ නියමන්ට අනුව නිවාස දුරකථන, ජංගම දුරකථන හෝ අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමේදී දැරීමට සිදුවන උපකරණ හා උපාංග සඳහා වූ පිරිවැය අදාල නිලධාරියා විසින් දැරිය යුතු වුවද, අධිකාරියේ සභාපතිවරයා වෙත රු. 105,878 ක් වටිනා ජංගම දුරකථනයක් හා ඒ සඳහා අවශ්‍ය උපාංග අධිකාරියේ වියදමින් මිලදීගෙන තිබුණි. |

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2015** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය අතිරික්තය රු.**21,968,427** ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.**10,449,154** ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.**11,519,273** ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.**14,476,438** කින් පහළ යාම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ **04** ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී **2011** වර්ෂයේ සිට **2013** වර්ෂය දක්වා මූල්‍ය ඌනතාවයන් පෙන්නුම් කළ නමුත් **2014** හා **2015** වර්ෂවල මූල්‍ය අතිරික්තයක් ලබා තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු ආයතනයේ දායකත්වය **2011** වර්ෂයේ සිට **2015** වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනයක් පෙන්නුම් කර තිබූ අතර **2014** වර්ෂයේ රු. **95,680,105** ක දායකත්වයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වර්ධනය සියයට **6** ක් විය.

**3.2** විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සහාධිපත්‍ය දේපල සඳහා සහතික නිකුත් කිරීමේ ආදායම රු. **16,000,000** කින් එනම් සියයට **17** කින් පහළ ගියද පසුගිය වර්ෂයට සාපේක්ෂව සේවා ගාස්තු ආදායම රු. **15,700,000** කින් එනම් සියයට **990** කින් ඉහළ යෑම හේතු කොට ගෙන පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම සැලකිය යුතු වෙනස්වීමක් සිදුවී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ශුද්ධ වත්කම් රු. **33,509,521** ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ වත්කම් රු. **12,504,708** ක් විය. මේ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ශුද්ධ වත්කම්වල රු. **21,004,813** ක වර්ධනයක් නිරීක්ෂණය විය.

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කාර්යසාධනය

(අ) සහාධිපත්‍ය දේපලවල පොදු පහසුකම් කළමනාකරණය, නඩත්තුව, පාලනය හා පරිපාලනය කිරීම, ඒවා නිසිලෙස ඉටුකිරීම සඳහා කළමනාකරණ සංස්ථාවට මග පෙන්වීම හා ඒ සඳහා සහායවීම සහ නඩත්තුව පැහැර හරින අවස්ථාවන්හිදී ඍජුව මැදිහත් වීම **1973** අංක **10** දරන පොදු පහසුකම් මණ්ඩල පනත අනුව අධිකාරියේ ප්‍රධාන අරමුණ විය. අධිකාරියේ කාර්යසාධනය සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයෙන් අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(i) අධිකාරිය විසින් සහාධිපත්‍ය දේපළවල කළමනාකරණ සංස්ථා සක්‍රීයව පවත්වා ගෙන යායුතු වුවත් අධීක්ෂණ දූර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරිය විසින් පිහිටුවන ලද කළමනාකරණ සංස්ථා **666** කින් **393** ක් එනම් සියයට **60** ක් අක්‍රීයව පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී සහාධිපත්‍ය සහතික නිකුත් කිරීමේ භෞතික ප්‍රගතිය සහ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 71 ක් හා සියයට 39 ක් වූ අතර සහාධිපත්‍ය දේපළ 100 ක් රක්ෂණය කිරීම සඳහා කළමනාකරණ සංස්ථා පෙළඹවීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී ඉන් එකදු දේපලක්වත් රක්ෂණය කර නොතිබුණි.

(iii) සුනාමි ව්‍යසනයට පත්වූ ජනතාව සඳහා ඉදිකරන ලද සහාධිපත්‍ය නිවාස ක්‍රම 112 ක් වෙනුවෙන් රු.10,000,000 ක ප්‍රතිපාදන මත සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීමේ සහතික ලබාදීමට ඉලක්ක කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ඉන් එකදු සහතිකයක් වත් ලබාදීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(iv) ආලෝකපුර, හිල්ඩා සහ සමුද්‍ර ශක්ති නිවාස ක්‍රම ප්‍රතිසංස්කරණ කටයුතු නිමකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් රු.80,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබූ නමුත් ඒ සඳහා රු. 44,576,839 ක් පමණක් වැයකර තිබූ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 50 ක පහළ අගයක් ගෙන තිබුණි.

(v) ක්‍රියාකාරී සැලැස්මට අනුව ලියාපදිංචි නොකරන ලද රජයේ /පුද්ගලික දේපළ නියමානුකූල කිරීම, අක්‍රිය කළමනාකරණ සංස්ථා සඳහා පරිපාලකවරු පත්කිරීම සහ සහාධිපත්‍ය දේපල පදිංචිකරුවන් පත්විය හැකි අවදානමකින් මුදවා ගැනීම සඳහා පදිංචියට නුසුදුසු එම දේපල පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමුකිරීම, සමාලෝචිත වර්ෂය තුළ කළ යුතුව තිබුණද ඒ කිසිදු කටයුත්තක් ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි.

**4.2** කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වගකීම් කාලය ඉක්මවූ ආරක්ෂිත ඇප තැන්පතු රු.655,479 ක්, රඳවාගැනීමේ මුදල් (Retention) රු.3,238,050 ක් සහ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් ඇප තැන්පතු රු.107,300 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) විගණන පරීක්ෂාවේදී පෙන්වා දී තිබුණු නිවාස සංකීර්ණ ගොඩනැගිලි අළුත්වැඩියාවේ දී ප්‍රමාණපත්‍ර වලට අනුව ඉටු නොකරන ලද වැඩ විෂයයන් සඳහා 2013 වර්ෂයේදී සාවද්‍ය ලෙස ගෙවා තිබූ රු.3,839,596 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කොන්ත්‍රාත්කරුගෙන් අයකරගෙන නොතිබුණි.

(ඇ) 1973 අංක 10 දරන සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනත සහ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනත්වල අත්‍යාවශ්‍ය සංශෝධනයන් සිදුකිරීමට සමාලෝචිත වර්ෂය තුළදී සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් අදාළ සංශෝධනයන් සිදුකර නොතිබුණි.

**4.3** කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 මාර්තු 07 දිනැති අංක 14/0014/517/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2013 දෙසැම්බර් 29 දින විශ්‍රාමලත් සාමාන්‍යාධිකාරිවරයාගේ සේවය කොන්ත්‍රාත් පදනම මත

වසරක කාලයකට නැවත අධිකාරියට ලබාගැනීමටත් එම කාල පරිච්ඡේදයෙන් පසු එම තනතුර සඳහා පත්කිරීමට සුදුසු අනුප්‍රාප්තිකයෙකු ඔහුගේ අධීක්ෂණය යටතේ පුහුණු කිරීමටත් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා තිබුණද, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2016 අප්‍රේල් 30 වන විටත් එම තනතුර පුරප්පාඩුව පැවතුණි.

(ආ) අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නියාමන) තනතුර සහ සහකාර සාමාන්‍යාධිකාරි තනතුරු 07 ක් දීර්ඝ කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවතුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2015 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලසුම තුළ ඇතුළත් උපාය මාර්ගවලට අදාළ ක්‍රියාකාරකම් වල කාර්යසාධන ඇගයීම සඳහා දර්ශකයන් (Indicators) පිළියෙල කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 18 සිට සියයට 127 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

අධිකාරිය විසින් 2012 හා 2013 වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වාහන පාලනය | ලොග් පොත් නිසි පරිදි නඩත්තු කර නොතිබීම හා ඉන්ධන පරීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබීම. |
| (ආ) | සභාධිපත්‍ය දේපල කළමනාකරණය | කොළඹ නගරයෙන් බැහැර දිස්ත්‍රික්කවල ඉදිවන දේපල හඳුනා ගැනීමට ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම. |
| (ඇ) | මූල්‍ය පාලනය | වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) | අයවැය පාලනය | අයවැය ලේඛනය තාත්වික පදනමකින් පිළියෙල නොකිරීම හා වියදම් පාලනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම. |